නල්ලූර් ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 පෙබරවාරි 02 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 මාර්තු 20 දින ඉදිරිපත් කරන ලදි. වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 10 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.3 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට ලැබුණු උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව නල්ලූර් ප්‍රදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට බලපෑම් හැර 2012 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) වියදම් සහ ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වියදම් | | ආදායම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. |
| වැඩියෙන් දැක්වීම් | 02 | 67,445 | 01 | 1,057,888 |
| සාවද්‍ය වර්ගීකරණය | 01 | 61,900 | - | - |

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.

-------------------------------------

පාලන ගිණුම් අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,863,234 ක් වූ අතර උපකාරක ලේඛන අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,750,271 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

--------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.128,400,526 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකුල නොවීම්

----------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරික්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| (i) V පරිච්ඡේදයේ 132 වගන්තිය | - | විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව වර්ෂයකට රු.1000 ඉක්මවා සංග්‍රහ වියදම් නොදැරිය යුතුය. මෙම අවශ්‍යතාවයට පටහැනිව අමාත්‍යවරයාගේ අනුමැතිය රහිතව |

| | | |
|---|---|---|
| | | ආහාර පාන සඳහා රු.41,956 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ii) V පරිච්ඡේදයේ 158(1) වගන්තිය | - | හිඟ වරිපනම් බදු රු.5,696,529 ක් එකතු කිරීම පිණිස ලේකම්වරයා විසින් වරෙන්තු නිවේදන අත්සන් කොට නිලධාරීන්ට භාර දී නොතිබුණි. |

(ආ) ප්‍රාදේශිය සභා (මුල්‍ය සහ පරිපාලන) රීති - 1988

| | | |
|---|---|---|
| (i) II පරිච්ඡේදයේ 14 වගන්තිය | - | වැය විෂයය යටතේ ප්‍රතිපාදන ඉක්ම වූ වියදම් සඳහා නියමිත කාලයේදි යෝජනා සම්මත කරවා ගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 65 වගන්තිය | - | ආදායම් ලිපිකරු විසින් වෙළඳ බලපත්‍ර ගාස්තු රු.21,950 ක් ගෙවීම පැහැර හැරි අයගේ ලැයිස්තුවක් පිළියෙල කර ගෙවීමට ඉඩ ලබා දි ඇති කාලය අවසන් වූ විට ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) III පරිච්ඡේදයේ 76 වගන්තිය | - | අයවිය යුතු කුලී රු.1,438,174 ක් ගෙවීම ප්‍රමාද වීම් සභාපතිවරයා සහ ලේකම්වරයා වෙත දැන්වීමට ආදායම් ලිපිකරු විසින් කටයුතු කර නොතිබුණි. |
| (iv) III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | එක් එක් කාර්තුව තුලදි ඉඩම් ගනුදෙනු වලට අදාල මුද්දර ගාස්තු සහ උසාවි දඩ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. |
| (v) V පරිච්ඡේදයේ 140 වගන්තිය | - | නියමිත දිනයේ අත්තිකාරම් රු.3,643,940 ක් පියවීමට නොහැකි වීම පිළිබඳව ලේකම්වරයා |

| | | |
|---|---|---|
| | | මගින් සභාපතිවරයාගේ අවධානයට ලක්කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 396 - | මාස 06 ඉකුත් වූ රු.15,800 ක් වටිනා උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 9.2 වගන්තිය - | සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් ආදායම් පරිපාලක වෙත නිවාඩු දින වැටුප් රු4,962 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

----------------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.7,990,541 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.42,174,047 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

------------------

අයවැය ලේඛනයේ නිසි පරිදි පිළියෙල කර නොතිබු අතර, ඒ නිසා තථ්‍ය ආදායම් සහ අයවැය ගත ආදායම් අතර රු.5,985,199 ක් වූ වෙනසක් සහ තථ්‍ය වියදම් සහ අයවැයගත වියදම් අතර රු.9,845,579 ක් වූ වෙනසක් විගණනයේදි නිරික්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් වූ අයවැයගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ---------------- | ----------------- | --------- | --------------------- |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 2,777 | 2,660 | 5,697 |
| බදුකුලී | 21,913 | 24,515 | 1,438 |
| බලපත්‍ර ගාස්තු | 1,273 | 1,853 | 22 |
| වෙනත් ආදායම් | 61,787 | 52,736 | 69,185 |

2.3.2 ආදායම් අහිමිවීම්

--------------------

1999 වර්ෂයේ සිට විදුලිබලය සැපයීම පිළිබඳ කටයුත් ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාරදී තිබුණු නමුත්, වීථි ලාම්පු නඩත්තුව සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ නොතිබුණු බැවින් සභා බල ප්‍රදේශය තුල වීථි ලාම්පු නඩත්තුව සඳහා ගෙවන ලද රු.1,441,025 ක මුදලක් විදුලි බල මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ

--------------

සමාලෝචිත වර්ෂය සඳහා මහේස්ත්‍රාත් උසාවි වලින් ලැබිය යුතු රු.771,217 ක් වු උසාවි දඩ මෙම වාර්තාවේ දින දක්වා අයකර ගෙන නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

------------------

(අ) 2006, 2010 සහ 2011 වර්ෂ සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු.60,077,269 ක් වු මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 සහ 2011 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.57,182,927 ක් ඉකුත් වර්ෂයේ සමුච්චිත අරමුදලට නොගලපා ජර්නල් සටහන් අංක JF/2012/09 මගින් ප්‍රාග්ධන සංචිත අරමුදලට මාරුකර තිබුණි.

(ඇ) 2012 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

----------------------------

2.4.1 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

----------------------------------------------------------

සභාව විසින් 2011 වර්ෂයේදි මිලදි ගත් රු.30,430,200 ක් වටිනා ඉඩම් 03 ක් මෙම වාර්තාවේ දිනය දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණු බව නිරික්ෂණය විය.

විස්තර පහත දැක්වේ

| ඉඩමේ නම | වටිනාකම |
|---|---|
| | රු. |
| කුරුන්දපුලම් ඉඩම | 5,354,000 |
| කන්තායි කඩ්ඩියන් ඉඩම | 18,252,200 |
| සල්ලි කන්ඩවත්තායි ඉඩම | 6,824,000 |
| | 30,430,200 |

2.4.2 වාර්ෂික සමික්ෂණ මණ්ඩල වාර්තාව

------------------------------------------

වාර්ෂික සමික්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව විෂයයන් 66 ක අතිරික්තයක් සහ විෂයයන් 29 ක ඌණතාවයක් නිරික්ෂණය විය. සමික්ෂණ මණ්ඩලය විසින් හානි වූ ලෙස වාර්තා කර තිබුණු විෂයයන් 62 සම්බන්ධයෙන් තවදුරටත් කර නොතිබුණි.

2.5 ආර්ථික නොවු ගනුදෙනු

------------------------------

දෛනික කටයුතු නිසි පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින් අවසන් ගිණුම් පිළියෙල කිරිම සඳහා ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 3.2 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදි සහාව නිවාඩු දින වැටුප් ලෙස රු. 38,510 ක් නිලධාරින්ට ගෙවා තිබුණි.

2.6 අරමුණු වලට පටහැනි කාර්යයන්

-----------------------------------------

ක්‍රීඩා භාණ්ඩ මිලදි ගැනීම සහ කියවීමේ මාසය සඳහා වු වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.613,620 ක් ගෙවා තිබුණු අතර මෙම කටයුතු අරමුණු වලට පටහැනිව සිදුකළ ක්‍රියාකාරකම් ලෙස සැලකේ.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

2.7.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

--------------------------------------------

සමාලෝචිත වර්ෂයේදි ප්‍රාග්ධන වැඩ 15 ක් සඳහා වෙන්කරන ලද රු.10,958,000 ක් වු මුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණු අතර, ඉදිරි කාලපරිච්ඡේදයේදි ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරිම සඳහා රු.5,905,903 ක මුදලක් විවිධ ණයහිමි ගිණුමට මාරු කර තිබුණි.

2.7.2 සම්පූර්ණයෙන් අත්හැර දැමූ ව්‍යාපෘති.

----------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරිමට නියමිතව තිබු රු.1,550,000 කට ඇස්තමේන්තු කළ මාර්ග වැඩ සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011-2012 වර්ෂයේදී විෂයයන් 16 ක් සඳහා ගෙවිය යුතු ලෙස ගිණුම් ගතකල රු.5,321,724 ක් වූ ණයහිමියන් හට මෙම වාර්තාවේ දින දක්වා ගෙවීම් කර නොතිබුණි.

(ආ) 2009-2012 කාල පරිච්ඡේදයට අදාළ ආරක්ෂක ඇප තැන්පතු සහ නොගෙවූ වැටුප් රු.296,302 ක් අදාළ නිලධාරින්ට නොගෙවා තැන්පතු ගිණුමෙහි රඳවා ගෙන තිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i.) ආදායම් රැස්කිරීම
(ii.) ස්ථාවර වත්කම්
(iii.) ගිණුම්කරණය
(iv.) මානව සම්පත් කළමනාකරණය
(v.) පරිත්‍යාග
(vi.) විවිධ තැන්පතු
(vii.) අයවැය පාලනය
(viii.) ගබඩා විෂයයන්